# වැවිලි අමාත්‍යාංශය

# ජනතා වතු සංවර්ධන මණ්ඩලය

# ඇබෑර්තු

ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ පුරප්පාඩුව පවතින සාමාන්‍යාධිකාරී තනතුර සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන් ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. තෝරාගන්නා ලද අයදුම්කරුවන් රජය විසින් නිකුත් කරන ලද හා ඉදිරියේදී නිකුත් කිරීමට අපේක්ෂිත අණ පණත් හා ආයතනික නීති රීති, රෙගුලාසි හා ප්‍රතිපත්තිවලට අනුකූලව තනතුරට අදාල කාර්යයන් ඉටුකිරීමට මනා හැකියාවක් ඇති අය විය යුතුය.

<u>*සාමාන්‍යාධිකාරී*</u>

ආයතනයෙහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවරා දෙනු ලබන බලතල, කාර්යයන් හා වගකීම් එම අධ්‍යක්ෂ මණ්ඩලයේ මගපෙන්වීම හා පරිපාලනය යටතේ ඉටුකරමින් ආයතනික කාර්ය මණ්ඩලයට නායකත්වය දෙමින් ද කාර්ය මණ්ඩලය දිරිගන්වමින් ද ආයතනය ඉහලම ඵලදායීතාව කෙරෙහි යොමුකරවීම ද ආයතනයෙහි සමස්ථ කාර්ය සාධනය සම්බන්ධයෙන් මූලික වගකීම හා වගවීම දැරීම ද සාමාන්‍යාධිකාරී තනතුර දරණ අයට පැවරෙන කාර්ය භාරය වේ.

*සුදුසුකම් හා පළපුරුද්ද*

බාහිර අයදුම්කරුවන්

(අ) කෘෂිකර්මය / විද්‍යාවේදී කළමනාකරණ විෂය ක්ෂේත්‍රයකින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධියක් ලබා තිබීම.

සමග

කෘෂිකර්මය / විද්‍යාවේදී කළමනාකරණ විෂය ක්ෂේත්‍රයකින් පශ්චාත් උපාධියක් ලබා තිබීම හෝ කළමනාකරණය පිළිබඳ පිළිගත් වෘත්තීය ආයතනයක ආශි්‍රත සාමාජිකත්වය ලබා තිබීම.

සහ

උපාධි සුදුසුකම් ලබා ගැනීමෙන් පසුව රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක කළමනාකාර මට්ටමේ තනතුරුවල අවම වශයෙන් වසර **20** ක පළපුරුද්ද (අවම වශයෙන් මින් වසර **05** ක් වත් ජ්‍යෙෂ්ඨ කළමනාකාර මට්ටමේ විය යුතුය.)

හෝ

(ආ) කෘෂිකර්මය / විද්‍යාවේදී කළමනාකරණ විෂය ක්ෂේත්‍රයකින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධියක් ලබා තිබීම.

සමග

කෘෂිකර්මය / විද්‍යාවේදී කළමනාකරණ හෝ වෙනත් අදාළ විෂය ක්ෂේත්‍රයකින් ආචාර්ය උපාධියක් ලබා තිබීම.

සහ

ආචාර්ය උපාධියක් ලබාගැනීමෙන් පසු රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක ජ්‍යෙෂ්ඨ කළමනාකාර මට්ටමේ අවම වශයෙන් වසර **05** ක විශිෂ්ඨ සේවා වාර්තාවක් හිමි නිලධාරියෙකු වශයෙන් පළපුරුද්ද.

| | | |
|---|---|---|
| සේවා ගණය | : | "ජ්‍යෙෂ්ඨ කළමනාකාර" |
| වැටුප් තලය | : | **HM 2-1 (රු.91,645 - 12 x 2,700 - 124,045)**<br>හා ජීවන වියදම් දීමනාව |
| වයස | : | අවු: **35** ට නොඅඩු හා අවු: **55** ට නොවැඩි විය යුතුය. |

දිප ව්‍යාප්ත සේවාවේ I වන පන්තියේ නිලධාරීන් අයදුම්කරන්නේ නම්, අන්තර්ග්‍රහනය කිරීමේ පදනම මත බඳවාගැනීමේ පටිපාටියේදී ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

<u>පොදු</u>

**පත්වීමේ ස්වභාවය** ස්ථිර, සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල් සඳහාහිමිකම් සහිතයි.

**සෑම අයදුම්කරුවෙකුම,**

- **i.** ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
- **ii.** තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.
- **iii.** විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතු ය.
- **iv.** අනුමත බඳවාගැනීමේ පටිපාටිය අනුව සියළුම අවශ්‍යතාවයන් සපුරාලිය යුතුය.

සුදුසුකම් ඇති අයදුම්කරුවන් සඳහා සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුසු නිළධාරියා තෝරාගනු ඇත. අයදුම්කරු පිලිබඳ තොරතුරු විමසිය හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම්ද සහිතව සකස්කරන ලද අයදුම්පත් 2023 මැයි මස 10 වන දින හෝ ඊට ප්‍රථම සභාපති, ජනතා වතු සංවර්ධන මණ්ඩලය, 55/75 වොක්ෂෝල් පටුමග, කොළඹ 02 යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතු අතර ඉල්ලුම් කරන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙලවරේ සඳහන් කල යුතුය.

**සභාපති**
**ජනතා වතු සංවර්ධන මණ්ඩලය**
**නො.55/75, වොක්ෂෝල් පටුමග, කොළඹ 02.**
**2023.04.24**